www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාණ්ඩුව 2002 සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වෙයි

## Sri Lankan government pulls out of 2002 ceasefire agreement

**විජේ ඩයස් විසිනි**
**2008 ජනවාරි 9**

දෙවසරක් තිස්සේ අප්‍රකාශිත සිවිල් යුද්ධයක් ගෙන යාමෙන් පසුව, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ඇති කර ගෙන තිබුනු 2002 සටන් විරාම ගිවිසුමෙන් තමන් ඉවත් වන බවට ජනවාරි 2 වන දා ශ්‍රී ලංකාණ්ඩුව නිවේදනය කලේ ය. මෙම තීරනය එල්ටීටීඊය මිලිටරිමය වශයෙන් වනසා දැමීම ඉලක්ක කර ගත් සටන් තව දුර වර්ධනය කිරීමකටත් 25 වසරක ගැටුම සම්බන්ධයෙන් මොන යම් ආකාරයක හෝ සාම සාකච්ඡාවක් සහ සාකච්ඡාමය විසඳුමක් පිලිබඳ අපේක්ෂාවක් පැවතුනේ නම් එය ක්‍රියාකාරීව අවසන් කර දැමීමටත් අවශ්‍ය පදනම සකස් කරයි.

ආන්ඩුව පසු ගිය සතියේ සිය තීරනය පිලිබඳව කොලඹ පිහිටි නෝර්වීජියානු තානාපති කාර්යාලයට දැනුම් දුන්නේ ය. සාම ක්‍රියා දාමයේ පහසුකම් සපයන්නා ලෙස ක්‍රියා කරමින් සිටි, සටන් විරාමය අධීක්ෂනය කල ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවට (එස්එල්එම්එම්) නායකත්වය දුන් නෝර්වේ රාජ්‍යය දැන් රටෙන් ඉවත්ව යන්නට බඩුමුට්ටු අසුරමින් සිටී. අවශ්‍ය කරන දින 14 පූර්ව නිවේදන කාලය නිමා වීමෙන් අනතුරුව, සටන් විරාම ගිවිසුම නිල වශයෙන් අවසන් වන්නේ ජනවාරි 16 වන දා ය.

ශ්‍රී ලංකාවේ උතුරුදිග ප්‍රදේශයේ දැනට මත් සටන් තීව්‍ර කොට තිබේ. පසු ගිය දින පහ තුල, වව්නියාව, මන්නාරම සහ යාපනය දිස්ත්‍රික්කවල දී එල්ටීටීඊ සටන්කරුවන් 94 දෙනෙකු ඝාතනය කොට ඇති බවත් සොල්දාදුවන් 4 දෙනෙකු ජීවිතක්ෂයට පත් වී ඇති බවත් මිලිටරිය කියා සිටී. මිය ගියවුන්ගෙන් එක් අයෙක්, එල්ටීටීඊ රහස් ඔත්තු අංශයේ ප්‍රධානියෙකු වන, සෙන්පති චාල්ස් ලෙස ද හඳුන්වනු ලබන ෂන්මුගනාදන් රවිශංකර් බව කියැවුනි. ඊයේ, ශ්‍රී ලංකාවේ ජාතිය ගොඩ නැගීමේ ඇමති ද.මු. දසනායක කොලඹ අගනුවර ආසන්නයේ දී ඔහුගේ මෝටර් රථය එල්ල කොට සිදු කරන ලද බෝම්බ පිපිරවීමකින් ඝාතනයට ලක් වූ අතර, මෙය එල්ටීටීඊය විසින් සිදු කරන ලද්දක් වන්නට ඉඩ තිබේ.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය පවසන ආකාරයට අනුව, ජනවාරි 2 වන දා පැවති කැබිනට් රැස්වීමක දී අගමැති රත්නසිරි වික්‍රමනායක සටන් විරාමය අවලංගු කල යුතු යැයි යෝජනා කලේ ය. එදා ම, සැනෙකින් එල්ටීටීඊයට දොස් පවරමින් බෝම්බ පිපිරීමක් පිලිබඳව වික්‍රමනායක කල සැඳහුමක් හැරුනු විට, ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ආන්ඩුව සිය තීරනය සම්බන්ධයෙන් කිසිදු සැලකිය යුතු පැහැදිලි කිරීමක් කර නැත. ආන්ඩුවේ ප්‍රකාශක අනුර ප්‍රියදර්ශන යාපා, කිසිදු හේතුවක් නො දක්වා, සටන් විරාමය "තව දුරටත් ප්‍රායෝගික නැතැ" යි කී ය.

තාවකාලික සටන් නැවැත්වීම පැවතියේ ලියවිලි තුල පමනක් බවත් එය "විහිලුවක්" බවත් දෙසැම්බර් 30 වන දා සන්ඩේ ඔබ්සර්වර් පුවත්පතට කියා සිටිමින් ජනාධිපතිගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සටන් විරාමය බිඳ දැමීම සම්බන්ධයෙන් එල්ටීටීඊයට ඍජුව ම දොස් පැවරී ය. තමන්ගේ සොහොයුරා ජනාධිපති පදවිය භාර ගන්නා විට, "3,000 වතාවක් සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරල තිබුනා. හැම දෙනා ම දන්නව එල්ටීටීඊය කරපු දේ, ඔවුන් කිසි විටෙක සාමයට කැපවූයේ නැහැ. ඔවුන් කෙරුවෙ තමන්ගෙ මිලිටරිය සහ ආයුධ බලය ශක්තිමත් කර ගන්න සටන් විරාමය වාසියට ගත්ත එකයි", ආරක්ෂක ලේකම් පැවසී ය.

යථා වශයෙන් ගත් විට, සටන් විරාමය ඉරා දැමීම සඳහා ආන්ඩුව ගත් තීරනය වනාහි පසු ගිය දෙවසර තිස්සේ තමන් යලි යුද්ධය දෙසට හැරීම මගින් සංකීර්නත්වයට පත් කරන ලද වැඩෙන සමාජ සහ දේශපාලන ආතතීන්ට එය දැක්වූ ප්‍රතිචාරය යි. පිරිහෙන ජීවන තත්ත්වයන් සම්බන්ධයෙන් වැඩෙන විරෝධතාවන්ට සහ කාර්මික ක්‍රියාවන්ට මුහුන දුන් ජනාධිපති රාජපක්ෂ, වාර්ගික රේඛා දිගේ වැඩ කරන ජනතාව බෙදා ලීම පිනිස සහ මර්දනකාරී පොලිස් රාජ්‍ය පියවරයන් දෙසට හැරී ගැනීම යුක්ති සහගත කරනු පිනිස එල්ටීටීඊයට එරෙහි යුද්ධය තීව්‍ර කොට, දෙමල විරෝධී හැගීම් අවුලුවා තිබේ.

සටන් විරාමය අවලංගු කිරීම සඳහා බල කල ආසන්න හේතුව වූයේ ආරක්ෂක වියදම් රුපියල් බිලියන 167ක් දක්වා, එනම් මින් තුන් වසරකට පෙර පැවති මට්ටම මෙන් තුන් ගුනයක් දක්වා ඉහල නැංවූ රාජපක්ෂගේ මෑත ම අයවැය වටා පැන නැගි දේශපාලන අර්බුදයකි. යුද වියදම්වලට මුදල් වෙන් කිරීම සඳහා තව තවත් ආර්ථික බර පැටවීමට එරෙහිව පුලුල්ව පැතිරෙන

විරුද්ධත්වයේ පීඩනය යටතේ සිය බිඳෙනසුලු සන්ධානයේ සාමාජිකයන් පක්ෂය හැර යන බවට තර්ජනය කල තතු යටතේ, දෙසැම්බර් 14 දා පැවති අවසන් ඡන්ද විමසීමේ දී තමන් පරාජයට පත් වේ ය යන බලාපොරොත්තුවට ආන්ඩුව මුහුන දී සිටියේ ය.

අයවැය පිලිබඳ ඡන්ද විමසීමට දින කීපයකට පෙර ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය (ශ්‍රීලංමුකො) විරුද්ධ පක්ෂයට මාරු විය. රාජපක්ෂගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) සාමාජිකයන් නැවෙන් පනින්නට සූදානමින් සිටි බව එහි ආරම්භක නායකයාගේ පුත්‍රයා වූ අනුර බන්ඩාරනායක ඉල්ලා අස් වීමෙන් ඇඟවුනි. ඒ අතරවාරයේ, පාලක සන්ධානයට පිටින් හිඳිමින් ආන්ඩුවට සහාය දෙන සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), දුප්පත් ජනයා අතරින් තමන්ට ලැබෙන සහාය වැඩි දියුනු කර ගැනීමේ අභිලාෂයෙන් තමන් ද අයවැයට එරෙහිව ඡන්දය දෙන බව අඟවා සිටියේ ය.

කෙසේ වුව ද, අන්තිම මොහොතේ ජනාධිපතිගේ තවත් සොහොයුරෙකු වන බැසිල් රාජපක්ෂ සමග කල කතාබහෙන් අනතුරුව ජවිපෙ ඡන්දය දීමෙන් වැලකී සිට අයවැය සම්මත කර ගැනීම සඳහා ඉඩ සලසා දුන්නේ ය. එම සාකච්ඡාවේ දී කතාබහට ලක් වූ කාරනා කිසි විටෙකත් ප්‍රසිද්ධියට පත් නොකෙරුන ද, එල්ටීටීඊය විනාශ කිරීම සඳහා තමන්ට පවතින මුලු ශක්තිය යොදා කරන යුද්ධයක් දියත් නොකිරීම සම්බන්ධයෙන් ආන්ඩුව විවේචනයට ලක් කල ජවිපෙ, කාරනා හතරකින් සමන්විත ඉල්ලීම් මාලාවක් ඉදිරිපත් කොට තිබුනි. ඒ ඉල්ලීම් සියල්ල අයවැය කෙරෙහි එල්ල වූ බලපෑම වැඩි දියුනු කරනු වෙනුවට යුද්ධය ඉහල නැංවීම සමග සම්බන්ධ වූ ඒවා විය. ඒ අතරින් අතිශයින් ම අර්ථභාරී කාරනා දෙක, එනම් සටන් විරාමය අවලංගු කිරීම සහ සටන් විරාම නිරීක්ෂන කමිටුව නෙරපා දැමීම මේ වන විට සිදු කොට තිබේ. අනෙක් සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් මෙන් ම ජවිපෙ ද එල්ටීටීඊයට හිතපක්ෂපාතීකම් දැක්වූයේ යැයි කියන නෝර්වේ රාජ්‍යය සහ සටන් විරාම නිරීක්ෂන කමිටුව කටුක ලෙස විවේචනය කර තිබේ.

## දිග් ගැසුනු ක්‍රියා දාමයක්

ගිවිසුම බිඳ වැටීමෙන් අවධාරනය කෙරෙන්නේ දේශපාලන සංස්ථාපිතයේ මොන ම කොටසකට හෝ සිය ප්‍රතිගාමී යුද්ධය නවතා ලීමට ඇති නොහැකියාව යි. 2000 දී එල්ටීටීඊ ප්‍රහාර හමුවේ මිලිටරිය විශාල පරාජයන්ගෙන් පීඩා වින්දේ ය. රටේ ඉතිහාසයේ ප්‍රථම වතාවට 2001 දී ආර්ථිකය ඍනාත්මක වර්ධනයක් අත්දැකී ය. 2002 පෙබරවාරියේ දී එක්සත් ජාතික පක්ෂය (එජාපය) නායකත්වය දුන් අගමැති රනිල් වික්‍රමසිංහගේ සන්ධානය සටන් විරාමයට අත්සන් තැබුවේ එම පසුබෑම්වලින් අනතුරුව ය. සැප්තැම්බර් 11 දා ප්‍රහාර සිදු වූ ආසන්න සමයේ දී, බුෂ් පාලනාධිකාරයේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" වාසිදායක කොන්දේසි මත "ත්‍රස්තවාදී" එල්ටීටීඊයට සාකච්ඡා සඳහා බල කිරීමට යොදා ගත හැකි උත්කෘෂ්ට අවස්ථාවක් බව පාලක ප්‍රභූවේ කොටස් වටහා ගත්තේ ය. ඉක්මනින් ම, ශ්‍රීලනිපය නායකත්වය දුන් ආන්ඩුව බිඳ වැටී අනතුරුව එජාපය සහ එහි සන්ධානකරුවන් මහ මැතිවරනයෙන් ජය ගත් අතර, සාම සාකච්ඡා සඳහා වූ පූර්විකාවක් වශයෙන් සටන් විරාමයට අත්සන් තැබුනි.

එල්ටීටීඊය සමග බලය බෙදා ගනීමක් සඳහා වූ තල්ලුව, කිසි කලෙකත්, සාමන්‍ය වැඩ කරන ජනතාව මත යුද්ධයෙන් ඇති වූ බලපෑම පිලිබඳව වූ උත්සුකතාවන්ගෙන් මෙහෙයවුනේ නො වේ. ඒ වෙනුවට 1983 දී යුද්ධය දියත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වන එජාපය නියෝජනය කලේ, විදේශ ආයෝජන ආකර්ෂනය කර ගැනීම සඳහා සහ දකුනු ආසියාවේ, විශේෂයෙන් ම ඉන්දියාවේ වේගවත් ආර්ථික වර්ධනයට දිවයින ඒකාග්‍ර කිරීම සඳහා යුද්ධය බාධකයක් යැයි එවක දැක ගෙන සිටි සංගත ප්‍රභූවේ කොටස් ය. කෙසේ වුව ද, ශ්‍රී ලාංකික ධනේශ්වරය නිදහස ලද දා පටන් පදනම්ව සිටි පාලක දේශපාලන විධික්‍රම සමග, එනම් දෙමල විරෝධී ස්වෝත්තමවාදය සමග සාම සාකච්ඡා ආරම්භයේ සිට ම ගැටෙන්නට විය. ඉක්මනින්ම, "ජාතික ආරක්ෂාවට වල කපමින්" සහ රට බෙදමින් සාකච්ඡාවල දී එල්ටීටීඊයට යටත් වෙමින් සිටින්නේ යැයි ශ්‍රීලනිපයේ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගෙන්, ජවිපෙන් හා මිලිටරි ධූරාවලියෙන් එජාපයට විවේචන එල්ල විය.

2005 නොවැම්බරයේ පැවති ජනාධිපතිවරයේ දී රාජපක්ෂ යන්තමින් වික්‍රමසිංහ පරාජය කර ගත්තේ ජවිපෙ සහ තවත් සිංහල අන්තවාදී පක්ෂයක් වන ජාතික හෙල උරුමය (ජාහෙඋ) මත පදනම් වෙමිනි. "මහින්ද චින්තනය" යැයි නම් කරන ලද ඔහුගේ මැතිවරන ප්‍රකාශනයට, සටන් විරාම ගිවිසුම පිලිබඳ විවේචනයක් සහ මිලිටරියට රුකුල් දීමක් ඇතුලුව ජවිපෙ ඉල්ලීම් ගනනාවක් අන්තර්ගත විය. සාමයේ මිනිසා යැයි කියා ගන්නා අතරවාරයේ රාජපක්ෂගේ ප්‍රකෝපකාරී ක්‍රියා මාර්ගය පැහැදිලිව ම එල්ටීටීඊයට එරෙහිව යලි යුද්ධය ඇරඹීම සඳහා වූ සූදානමක් විය.

ඊනියා සාම ක්‍රියා දාමය අධීක්ෂනය කල මහ බලවතුන්ගේ සහාය අඛන්ඩව පවත්වා ගෙන යනු පිනිස ඔහුගේ ආන්ඩුව දිගින් දිගට ම නාමිකව සටන් විරාමයෙහි ඇලී සිටියේ ය. යුද්ධය වෙත අපරීක්ෂාකාරීව ආපසු හැරීමක් මගින් මහජන විරුද්ධත්වය උසි උන්වෙනු ඇතැයි යන්න ගැන රාජපක්ෂ ද උත්සුක විය. මේ අතරවාරයේ ම මිලිටරිය බැඳ ලා තිබූ රුහැන් මුදා ලූ අතර, ඒ සැනින් ම වාගේ ප්‍රකෝපකාරීත්වයන් ඇරඹුනි.

2005 නත්තල අද්දර දී, නැගෙනහිරදිග මඩකලපු නගරයෙහි මැදියම් රාත්‍රියේ පැවති පූජාවකට සහභාගි වෙමින් සිටිය දී, ප්‍රධාන පෙළේ එල්ටීටීඊ හිතවාදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ ජෝශප් පරරාජසිංහම් වෙඩි තබා ඝාතනය කෙරුනි. 2006 ජනවාරියේ දී, විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයෙන් සමත් වීම සම්බන්ධයෙන් සාදයක් පවත්වමින් සිටි ත්‍රිකුනාමලයෙහි දෙමල තරුනයන් පස් දෙනෙක් ලේ වැකි අයුරින් ඝාතනය කරන ලදහ. සිදුවීම් දෙකේ දී ම, මිලිටරිය සහ ඒ හා සන්ධානගත දෙමල අර්ධ මිලිටරි කන්ඩායම් ඊට සම්බන්ධ වූ බව තත්ත්වයන් මගින් බලගතු ලෙස ඇඟවුනි.

සාම සාකච්ඡා යලි පන උන්වීම සඳහා සාම ක්‍රියා දාමයේ සමසභාපතිවරුන්, එනම් එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ රාජ්‍යය විසින් දරන ලද උත්සාහයෝ ඉක්මනින් ම දුෂ්කරතාවන්ට මුහුන දුන්හ. සටන් විරාම් විසුම නැවත ලිවීම සඳහා ආන්ඩුව කල ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් සාකච්ඡාවලින් ඉවත්ව යන බවට එල්ටීටීඊය තර්ජනය කල විට, 2005 පෙබරවාරියේ දී ජිනීවාහි පැවති සාකච්ඡා වටය බිඳ වැටුනා හා සමාන විය. මාස දෙකකට පසුව සටන් විරාමය පිලිපැදීම සමාලෝචනය කිරීම සඳහා ඔස්ලෝවේ පැවත්වීමට නියමිතව තිබූ සාකච්ඡා, සිය නියෝජිත කන්ඩායමට එක ද කැබිනට් ඇමතිවරයෙකු වත් ඇතුලත් නොකිරීම මගින් ආන්ඩුව රැස්වීම කඩාකප්පල් කිරීමෙන් අනතුරුව අරඹන්නට පෙර ම අසාර්ථක විය. ඒ අතරවාරයේ, දෙමල ජනතාව තැති ගන්වමින් සහ ප්‍රතිචාර දැක්වීමට එල්ටීටීඊය පොලඹවමින්, මිලිටරිය එල්ටීටීඊය දුබල කිරීම ඉලක්ක කර ගත් සිය ආවෘත ප්‍රකෝපකාරී යුද්ධය දිගින් දිගට ම ගෙන ගියේ ය.

අනුග්‍රාහකාත්මක වන ලෙස එල්ටීටීඊයෙන් ඉල්ලා සිටින අතරවාරයේ ශ්‍රී ලාංකික මිලිටරියේ ක්‍රියාකාරකම් නුදුටු ඇස්ව සිටි මහ බලවතුන්ගෙන්, විශේෂයෙන් ම වොෂින්ටනයෙන් ලද නිහඬ සහාය මගින් රාජපක්ෂ දිරිමත් විය. බුෂ් පාලනාධිකාරයෙන් එල්ල වූ පීඩනය යටතේ, 2006 මැයි මාසයේ දී, යුරෝපය තුල පිටුවාහලේ සිටින දෙමල ජනයා අතර එල්ටීටීඊයට පවතින සැලකිය යුතු දේශපාලනික සහ මූල්‍යමය පදනමට වල කපමින් යුරෝපා සංගමය එය "ත්‍රස්තවාදී සංවිධානයකැ"යි නිල වශයෙන් නම් කලේ ය.

ජූලි මස අග, නැගෙනහිරදිග පිහිටි මාවිල්ආරු ප්‍රදේශයේ දී, මිලිටරිය එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශ අත්පත් කර ගැනීම සඳහා වූ සිය ප්‍රථම විවෘත ආක්‍රමනය දියත් කලේ ය. ආන්ඩුව එල්ටීටීඊය කල විරෝධය පෑමක වාසිය සැනෙකින් ඩැහැ ගත්තේ ය. ප්‍රදේශයේ ජනයාට පිරිසුදු පානීය ජලය සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ලද ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවන්නට ආන්ඩුව අසමත් වීම සම්බන්ධයෙන් විරෝධය පෑමක් වශයෙන් එල්ටීටීඊය වාරිමාර්ග සොරොව්වක් වසා දමා තිබුනි. මිලිටරිමය පියවරක් ගැනීම අවශ්‍ය වූයේ තමන්ගේ වගාවන් විනාශ වීමේ තර්ජනයට මුහුන දී සිටි සිංහල ගොවීන් සම්බන්ධයෙන් ඇති වන්නට ඉඩ තිබුනු " මානුෂීය ව්‍යසනය" වලක්වා ලීම සඳහා යැයි රාජපක්ෂ කියා සිටි මුත්, සටන අවසන් කිරීම සඳහා මැදිහත් වන්නට සටන් විරාම නිරීක්ෂන කමිටුව දැරූ උත්සාහයන් ඔහු ප්‍රතික්ෂේප කලේ ය. මිලිටරිය සිය ප්‍රහාර දියත් කිරීමේ දී, වහා ම සොරොව්ව විවෘත කිරීම සඳහා එල්ටීටීඊය සමග එකඟතාවකට පැමින සිටි සටන් විරාම නිරීක්ෂන කමිටුවේ නිරීක්ෂකයන්ගේ ජීවිත ද අනතුරේ හෙලී ය.

මාවිල්ආරු මෙහෙයුම වනාහි, සාම්පූර්, වාකරේ සහ අවසානයේ පසු ගිය ජූලි මාසයේ දී තොප්පිගල එල්ටීටීඊ බල කඳවුර අත්පත් කර ගනිමින් නැගෙනහිර ප්‍රදේශයෙහි දියත් කරන ලද ආක්‍රමන මාලාවක පලමු වැන්න යි. ජූලි 19 දා, නැගෙනහිර මුදා ගත්තේ යැයි නිවේදනය කරමින් ආන්ඩුව ජය සැමරීමේ හාස්‍යජනක ප්‍රීත්‍යෝත්සවයක් පැවැත්වී ය. කෙසේ වුව ජනතාව සම්බන්ධයෙන් ගත් විට, "මුදා ඇරීම" මගින් ඔවුන්ට ගෙන දී තිබුනේ මරනයත් දුක් කම්කටොලුත් පමනකි. 2006 ජූලි මාසයේ පටන් 5,000කට වැඩි ජනයා ඝාතනයට ලක් වී ඇති අතර, 250,000කට වැඩි පිරිමින්ට, ගැහැනුන්ට සහ ළමුන්ට සිය නිවෙස්වලින් අවතැන් වී සරනාගත කඳවුරුවල දිවි ගෙවන්නට බල කෙරී තිබේ. ආයෝජකයන් ආකර්ෂනය කර ගැනීම සඳහා අධිආරක්ෂිත කලාපයක් තුල පිහිටුවනු ලබන නව නිදහස් වෙලඳ කලාපයක් පිලිබඳව කල ඉක්මන් නිවේදනය මගින් ආන්ඩුවේ සැබෑ න්‍යාය පත්‍රය අවධාරනය විය.

පසු ගිය හය මාසය තිස්සේ, කිසිදු සැලකිය යුතු හදිසි ආක්‍රමනයක නො යෙදී මිලිටරිය උතුරුදිග ඉතිරිව පවතින එල්ටීටීඊ බල කඳවුරු කෙරෙහි සිත යොමු කරමින් සිට ඇත. නැගෙනහිර දී සන්නද්ධ හමුදාවලට අභිමුඛ වූයේ, කරුනා නමින් ද හඳුන්වනු ලබන වී. මුරලිදරන්ගේ නායකත්වය යටතේ පැවතී, තම සටන්කරුවන් අතර ඇති වූ ප්‍රධාන පෙලේ භේදයක් මගින් දුර්වල වී සිටි එල්ටීටීඊයකි. ආන්ඩුව ප්‍රතික්ෂේප කල ද, එල්ටීටීඊයට පහර දීමේ දී කරුනා කන්ඩායම ආරක්ෂක හමුදා සමග සමීපව ක්‍රියා කොට ඇති අතර, පසු ගිය දෙවසර තිස්සේ නැගෙනහිරදිග ප්‍රදේශයේ සිදු වූ බොහෝ පැහැර ගෙන යාම් සහ ඝාතනවලට ඔවුන් සම්බන්ධව සිටියේ යැයි පුලුල්ව විශ්වාස කෙරේ.

## සාම ක්‍රියා දාමයේ අවසානය

සටන් විරාම ගිවිසුමේ අවසානයෙන් සනිටුහන් වන්නේ ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියා දාමයේ බිඳ වැටීම යි. යලි සාකච්ඡා මේසය වෙත එලඹීම සඳහා

දින නියම කර න්නට ශ්‍රී ලංකාව තුල හෝ මොන යම් සමඅනුග්‍රාහක රටකින් හෝ කිසිදු කැඳවුම් කිරීමක් හෝ පියවර ගැනීමක් සිදු නො වීම සැලකිල්ලට ගත යුතු කරුනකි.

2002 දී සටන් විරාම ගිවිසුම අත්සන් කල විරුද්ධ පාක්ෂික එජාපය රාජපක්ෂගේ යලි ඇරඹූ යුද්ධය පිටුපස පෙල ගැසී තිබේ. "පවතින යථාර්ථය" විසින් සටන් විරාමය "අර්ථයක් නැති" දෙයක් බවට පත් කලේ යැයි ආන්ඩුවේ පිලිවෙත අනුයමින් ප්‍රකාශ කල එජාපයේ ජාතික සංවිධායක එස්.බී. දිසානායක, සටන් නැවැත්වීමක් සඳහා කැඳවුම් නොකලේ ය. ඔහු තාවකාලික සටන් විරාමය සඳහා අත්සන් තැබීමට ගත් තීරනය ආරක්ෂා කලේ එය සාමය පිලිබඳ අපේක්ෂාව දරා සිටියේ ය යන ආස්ථානයෙන් නො වේ, එමගින් එල්ටීටීඊය දේශපාලනිකව සහ මිලිටරිමය වශයෙන් දුර්වල කොට තිබූ බැවිනි. දිසානායක මෙසේ කී යඃ "වෙන ම රාජ්‍යයක් උදෙසා ඔවුන්ට කලින් තිබුනු ස්ථාවරය වෙනුවට එල්ටීටීඊය 'ෆෙඩරල්වාදය' පිලිගැනීම වැනි වාසි සාම සාකච්ඡා තුලින් අප ලබා ගෙන තියෙනව. ඊට අමතරව, සටන් විරාමය අතරතුර දී කරුනා කොටින් සමග සිටි සටන්කරුවන් භේද කලා".

ආන්ඩුව සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වීම සම්බන්ධයෙන් එල්ටීටීඊය මේ වන තෙක් කිසිදු නිල ප්‍රකාශයක් නිකුත් කොට නැත. ආරම්භයේ පටන් ම ඔවුන්ගේ ඉදිරි දර්ශනය වී තිබුනේ, එක් මහ බලවතෙකුගේ හෝ වැඩි ගනනකගේ සහායෙන් දිවයිනේ උතුරේ සහ නැගෙනහිරේ ධනපති රාජ්‍ය කැබලිත්තක් නිර්මානය කර ගැනීම කෙරෙහි ය. 2002 දී සටන් විරාමය පිලිගත් එය, 2002 දී පැවති පලමු සාකච්ඡා වටයේ දී "දෙමල ඊලම" සඳහා වූ සිය චිරකාලීන ඉල්ලීම නිල වශයෙන් අත හැරියේ ය. සැලකිය යුතු ස්වාධීනත්වයක් සහිතව උතුරේ සහ නැනෙහිරේ පලාත් ආන්ඩුවක් ගොඩ නගා දීමට හිලව්වක් වශයෙන්, නිදහස් වෙලඳ පොල ප්‍රතිව්‍යුහකරනය පිලිබඳ න්‍යාය පත්‍රයට මුලුමනින් සහාය දුන්නා වූ "ව්‍යාඝ්‍ර ආර්ථිකයක්" ගොඩ නගන්නට කොලඹ ආන්ඩුව සමග එක්ව වැඩ කිරීම සඳහා එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු වූ ඇන්ටන් බාලසිංහම් පොරොන්දු විය. සාකච්ඡා බිඳ වැටුනු තැන් පටන්, ආන්ඩුව යලි සාකච්ඡා මේසයට ඇද ගැනීම සඳහා "ජාත්‍යන්තර ප්‍රජාවට" ආයාචන කරන තත්ත්වයට එල්ටීටීඊය ඇද වැටී තිබේ.

සාම ක්‍රියා දාමය බිඳ විසිරවූ වඩාත් ම සැලකිල්ලට ගත යුතු නිමිත්ත වන්නේ, "ජාත්‍යන්තර ප්‍රජාව" විසින් සටන් අවසන් කිරීම සඳහා කිසිදු ඒකාබද්ධ උත්සාහයක් නොදැරීම යි. තමන් ආන්ඩුවේ තීරනය ගැන කනගාටුවට පත් වන බවත් ප්‍රචන්ඩත්වය තීව්‍ර වන අතරතුරේ සටන් විරාමයෙන් ඉවත් වීම "බරපතල කනස්සල්ලක් ඇති කරන්නක්" බවත් ප්‍රකාශ කරමින් එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්යාලයේ බාන් කයිමූන් අනුකම්පා සහගත නිවේදනයක් නිකුත් කලේ ය. ජපානයේ, බ්‍රිතාන්‍යයේ, කැනඩාවේ සහ ඉන්දියාවේ ආන්ඩු සියල්ල ම නිවේදන නිකුත් කල ද, ශ්‍රී ලංකාවේ ආන්ඩුව හෙලා දැකීම තබා විවේචනය කරන්නට වත් සාම ව්‍යායාමය යලි ඇරඹීම සඳහා කැඳවුම් කරන්නට වත් ඒවා සමත්  නො වී ය.

එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශක ෂෝන් මැක්කෝර්මැක් පැවසුවේ, "ශ්‍රී ලංකාවේ ගැටුමට කල් පවත්නා, සාමකාමී විසඳුමක් අත් කර ගැනීම වඩා දුෂ්කර තත්ත්වයට පත් කරන" මෙම තීරනයෙන් එක්සත් ජනපදය "අපහසුවට" පත් වූ බව යි. මෙම සැර බාල කල, කුහක ප්‍රතිචාරය වනාහි පසු ගිය හය වසරක එක්සත් ජනපද ක්‍රියා කලාපයේ කොටසකි. 2002-03 කාලය තුල දී බුෂ් පාලනාධිකාරය සාම සාකච්ඡාවලට සහාය දුන්නේ ශ්‍රී ලාංකික ජනතාව මුහුන දී සිටින ශෝචනීය තත්ත්වය ගැන එය උත්සුක වූ නිසා නො ව, ඇමරිකානු ආර්ථික සහ භූලෝපායාත්මක අවශ්‍යතාවන් දැවැන්ත ලෙස පුලුල් වී තිබෙන ඉන්දියාව ද ඇතුලු දකුනු ආසියාව තුල අස්ථාවරකරන බලපෑමක් ඇති කල යුද්ධයක් අවසන් කරන්නට ඊට පැවති උත්සුකතාව හේතුවෙනි. කොලඹ ආන්ඩුවේ කොන්දේසි මත එල්ටීටීඊය නුදෙනුවකට තල්ලු කිරීම සඳහා ප්‍රබල බලපෑමක් එල්ල කරන්නට අසමත් වූ කල්හි යුද්ධය යලි ඇරඹීම සඳහා රාජපක්ෂ ආන්ඩුව ගත් පියවරට වොෂින්ටනය මුලුමනින් ම සහාය දුන් අතර, මිලිටරිමය වශයෙන් ඊට උපකාර කොට තිබේ.

ශ්‍රී ලාංකික මහජනතාවට වඩ වඩාත් මරන ද විනාශය ද ගෙන දෙන යුද්ධයකට ආපසු යාම සම්බන්ධයෙන් සියලු මහ බලවතුන්, සියල්ලට මත් වඩා එක්සත් ජනපදය වගකිව යුතු ය.

© www.wsws.org